# රජයේ දැන්වීමයි

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට

# 5 ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2022

ඉහත විභාගය 2022 ඔක්තෝබර් මස 27 වන ඉරිදා දින පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනය 2022.07.29 වේ.

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත් විය හැක්කේ රජයේ පාසලක හෝ රජය විසින් අනුමත කරනු ලැබූ පාසලක 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ට පමණි.

ශිෂ්‍යාධාර පිරිනමනු ලබන්නේ 2023 ජනවාරි 31 වන දිනට වයස අවුරුදු 11 ට අඩු අවුරුදු 10 හෝ 10 ට වැඩි අඩු ආදායම් සහිත සිසුන් සඳහා පමණි.

අයදුම්පත් එවිය යුත්තේ මාර්ගගත (Online) ආකාරයෙනි. අයදුම් කිරීමේ උපදෙස් පත්‍රය, ව්‍යවස්ථාව, පරිශීලක නාම හා මුරපද සියලුම පාසල්වල විදුහල්පතිවරුන්ට මේ වන විට ලබා දී ඇත. එසේ නොලැබුන පාසල් ඇතොත් පාසල් ප්‍රධානීන් විසින් විභාග කොමසාරිස්, පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල වෙත පහත සඳහන් දුරකථන අංක අමතා නොපමාව ඉල්ලුම් කළ යුතුය.

විශේෂ අවශ්‍යතා ඇති සිසුන් පිළිබඳව ඉල්ලුම් කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් විස්තරාත්මකව උපදෙස් පත්‍රිකාවේ සඳහන් කර ඇත.

**විමසීම් :**

| | | |
|---|---|---|
| දුරකථන අංක | : | 011-2784537, 2786616, 2784208 |
| | | 011-2786200, 2784201, 2785202 |
| ක්ෂණික දුරකථන අංකය | : | 1911 |
| ෆැක්ස් අංකය | : | 011-2784422 |
| තැපැල් ලිපිනය | : | විභාග කොමසාරිස් ජනරාල්<br>පාසල් විභාග සංවිධාන ශාඛාව,<br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>පැලවත්ත, බත්තරමුල්ල. |

**එල්.එම්.ඩී. ධර්මසේන**
**විභාග කොමසාරිස් ජනරාල්.**

**6/5/ශිෂ්‍යත්ව/2022**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**පැලවත්ත, බත්තරමුල්ල.**
**2022.07.07**